[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 44 දරන
## යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල පනත

---

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 03 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 දෙසැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 6. 75 තැපැල් ගාස්තුව : රු. 3.50

**1999 අංක 44 දරන යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල පනත**

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 03 වැනි දින.]

එල්.ඩී. - ඕ. 8/95.

**ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මගින් ආබාධිත සහ අස්ථානගත වූ ළමයින්ගේ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද "යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල" නම් වූ අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ආබාධිත සහ අස්ථානගත ළමයින්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් ඔවුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය සඳහා විධිවිධාන සැලැස්වීම ද, එම කාර්යය සඳහා අරමුදලක් පිහිටුවීම ද ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන හෙයින් ; පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1**. මේ පනත 1999 අංක 44 දරන යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් අරමුදලට දෙන ලද නාමයෙන් එය සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ අරමුදල විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) අරමුදලේ පරමාර්ථය ඉටු කිරීමට හැකිවීමේ කාර්ය සඳහා රජය විසින් කලින් කල අරමුදලට ප්‍රදාන ලබා දිය හැකි ය.

**3**. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින් මතු විධිවිධාන සළස්වා ඇති පරිදි සංයුක්ත කරනු ලබන කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය. අරමුදලේ කළමනාකරණ මණ්ඩලය

(2) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලේ කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(අ) (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු

අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික මණ්ඩලයේ ලේකම් ජනරාල්වරයා ;

(ඇ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිවරයා ;

(ඈ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විශේෂ අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂවරයා ;

(ඉ) පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ;

(ඊ) සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ;

(උ) සංස්කෘතික හා ආගමික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(ඌ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයකු ;

(එ) මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතු ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික මණ්ඩලයේ නියෝජ්‍ය ලේකම් ජනරාල්වරයා ;

(ඒ) සභාපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකුගෙන් ඉන් එක් එක් තැනැත්තා (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් සභාපතිවරයා විසින් එම තැනැත්තා වෙත නිකුත් කරනු ලබන පත්වීමේ ලිපියේ නිශ්චිතව දන්වනු ලැබිය හැකි ධුර දැරිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ (ඒ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකුගේ පත්වීම සභාපතිවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ (ඒ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු තත්කාර්ය සඳහා සභාපතිවරයා අමතන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින විටක දී පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා පත් කරගනු ලබන යම් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය ද එම රැස්වීම්වල කටයුතු ද පාලනය කරනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත්කිරීමේදී සිදුවූ යම් දෝෂයක් තිබීමේ හේතුව මත පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

4. මණ්ඩලයට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් බලය තිබිය යුතු ය :- මණ්ඩලයේ බලතල

(අ) දේශීය වූ හෝ විදේශීය, මූලාශ්‍රවලින්, මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීමට ;

(ආ) මේ පනත මගින් හෝ යම් මිලදී ගැනීමක්, ප්‍රදානයක් ත්‍යාගයක් හෝ අන්‍යාකාරයකින් අරමුදල වෙත පැවරෙන යම් චංචල දේපළක් ලබා ගැනීමට හෝ දැරීමට නැතහොත් අරමුදලට හිමිකම් ඇති යම් චංචල දේපළක් විකිණීමට, ප්‍රදානය කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ;

(ඇ) අරමුදලේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට ;

(ඈ) අරමුදලේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම්වලට මණ්ඩලය කෙලින්ම

හෝ තත්කාර්ය සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධරයන් සහ සේවකයන් හෝ නියෝජිතයන්ගේ මාර්ගයෙන් ඇතුළත්වීමට හෝ එම කොන්ත්‍රාත් හෝ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට ;

(ඉ) මේ පනතේ විධිවිධානවලට යටත්ව අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් පත් කිරීමට, සේවයේ නියුක්ත කිරීමට හෝ ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීමට ද එම නිලධරයන්ගේ හා සේවකයන්ගේ පත්වීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික ගෙවීම්, විනය පාලනය සහ නිවාඩු සම්බන්ධයෙන් රීති සෑදීමට ;

(ඊ) අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීමට ද, මණ්ඩලයේ අභිමතය පරිදි එම ආයෝජන ආපසු ලබා ගැනීමට, නැවත ආයෝජනය කිරීමට සහ වෙනස් කිරීමට ; සහ

(උ) අරමුදලේ පරිපාලනයට අදාළ සියලු කටයුතු සම්බන්ධයෙන් රීති සෑදීමට.

මුදල් අරමුදලට මාරු කිරීම.

**5**. මේ පනතේ ආරම්භවීමේ දින සිට බලපාන පරිදි -

(අ) මහා භාණ්ඩාගාරයේ අංක 6,000-0-0-6-65 දරන ගිණුමේ (යුනෙස්කෝ අරමුදලේ) ඇති මුදල් ;

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රදානවල ඇති ඉතිරි කිරීම්

අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

යුනෙස්කෝ අරමුදල් ගිණුම.

**6**. මණ්ඩලය විසින් 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව යම් බලපත්‍රයක් වාණිජ බැංකුවක "යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් පවත්වා ගෙන යා යුතු අතර -

(අ) 5 වන වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් අරමුදලට පැවරෙන සියලු මුදල් ;

(ආ) අරමුදලට මුදල්වලින් දෙනු ලබන සියලු ත්‍යාග හෝ පරිත්‍යාග ;

(ඇ) ආයෝජනවලින් ලැබෙන ආදායම හෝ අරමුදලට ලැබිය යුතු වෙනත් ලැබීම් ;

(ඇ) පොත් විකිණීමෙන් ලැබෙන යම් ආදායමක් හෝ අරමුදල විසින් පවත්වනු ලබන විවිධ අරමුදල් රැස්කිරීමේ කටයුතුවලින් ලැබෙන වෙනත් ආදායම් ;

(ඉ) මේ පනත ආරම්භවීමේ දිනයට පසුව අරමුදලට උපචිත විය හැකි සියලු මුදල්.

එම ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

7. මණ්ඩලයේ විධානයට යටත්ව ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික මණ්ඩලයේ ලේකම් ජනරාල් අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධරයා විය යුතු ය. අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධරයා.

8. අරමුදලට අයත් මුදල් ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන පරමාර්ථ සඳහා යෙදවීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය :- අරමුදලේ මුදල් යොදවනු ලැබිය හැකි කාර්යයන්.

(අ) ආබාධිත හා අස්ථානගත ළමයින්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ආ) විකිණීම සඳහා පොත් පළකිරීම සඳහා වන වියදම් දැරීම.

9. (1) අරමුදලේ ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් ද යථා පරිදි ගිණුම් පොත් තැබීම සඳහා මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය. විගණනය සහ වාර්ෂික වාර්තාව.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) මණ්ඩලය විසින් සෑම වර්ෂයක් අවසානයේ දී ම ඒ වර්ෂය තුළ දී අරමුදලේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් වූ වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම වාර්තාව අදාළ වන්නේ යම් වර්ෂයකට ද ඒ වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර අමාත්‍යවරයා විසින් එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

10. අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. අරමුදලේ මුදල් වර්ෂය.

අරමුදල ඇතැම් බදු වලින් නිදහස් කිරීම.

**11**. අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අරමුදල මගින් ආනයනය කරන ලද අරමුදලේ පරමාර්ථ වැඩිදියුණු කර ගැනීම සඳහා උපකාර වන යම් භාණ්ඩ මත යම් රේගු බදු අය කිරීමෙන් අරමුදල නිදහස් කරනු ලැබිය හැකි ය.

රජයේ සේවකයන් අරමුදලේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**12**. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා අරමුදලේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එහි කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු අරමුදලේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු අරමුදලේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් රජයට සේවය කිරීමට එකඟ වෙමින් රජය සමඟ ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අරමුදල වෙත ඉටු කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුම යටතේ ඔහුගේ ඒ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා රජය වෙත කරන ලද සේවා කාලයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

රීති සෑදීමට මණ්ඩලයට ඇති බලතල.

**13**. මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කාරණයකට අදාළව අවශ්‍ය යයි මණ්ඩලය විසින් සළකනු ලැබිය හැකි රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

**14**. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා අරමුදලේ සියලු නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සළකනු ලැබිය යුතු ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සැළකිය යුතු බව.

**15**. අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**16**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**17**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

අර්ථ නිරූපණය.

"ආබාධිත ළමයා යන්නෙන්" ශාරීරික හා මානසික දුබලතාවක් ඇති පාසල් යන වයසේ ළමයෙක් අදහස් වේ ;

"අස්ථානගත ළමයා යන්නෙන්", තම දෙමාපියන් විසින් අත්හැර දමනු ලැබූ හෝ තම දෙමාපියන්ට එම ළමයාට ඉගැන්වීමට වත්කමක් නොමැති හෝ තම දෙමාපියන් මියගිය හෝ දැනට ජීවත්ව සිටින එම ළමයාගේ මවට හෝ පියාට එම ළමයාට ඉගැන්වීමට වත්කමක් නොමැති හෝ පාසල් යන වයසේ ළමයෙක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.